

# බිරින්දෑවරු

**හේමමාලි බණ්ඩාරනායක**

සෑම මවක්ම තම දරුවන්ගේ වැරදි වහනවා වගේම කසාද බිරිඳක් තම සැමියාගේ සියලු දෝෂ යට ගසා දමයි. ගීතා ද එවන් බිරිඳකි. සියලුම කසාද බිරින්දෑවරුන්ට පොදු ධර්මතාවය නාට්‍ය රචකයා අපූරුවට අප ඉදිරියට ගෙනෙයි.

"එයාට හරියට වැඩ. හදිස්සි ඔපරේෂන් එකක් නිසා එයා අද එන්නේ නෑ" ඇයගේ ගෙදරට හදිස්සියේ එන නාදුනන කාන්තාවට තම සැමියා ගැන එසේ පැවසීමෙන් මෙම ධර්මතාවය මොනවට පැහැදිලි වෙයි.

හදිස්සියේ කඩා පාත්වන මෙම නාදුනන කාන්තාව තම සැමියාගේ අනියම් බිරිඳ බව දැන ගන්නා ගීතාගේ හැසිරීමෙන් තමා පත්වන අපහසුතාව තීව්‍ර ලෙස අපටත් දැනෙන්නේ ඇයගේ රගපෑමේ දක්ෂතාවය නිසාමය. අනියම් බිරිඳ ඉරිසියා කරන්නේ ඔහුගේ නීත්‍යානුකූල බිරිඳටය. ඇයට ඔහු නැවත ආදරය කිරීම දරුවෙකු හදා ගැනීමට බිරිඳ සමග සැලසුම් කිරීම , ඒ හා සිහින මැවීම නිසා ඇය ව්‍යාකූල වී ඇත. ඉරිසියාවත් ඔහුගේ ආදරය අහිමි වීමේ ප්‍රබල මානසික බිඳ වැටීමත් නිසා ඇය ඕනෑම වැරද්දක් කිරීමට සූදානම්ය. ගීතාව අපහසුතාවට පත් කිරීමෙන් ඇය මානසික සුවයක් විදින බව පැහැදිලිය.

කසාද බිරිඳත් අනියම් බිරිඳත් අතර ඇති සදාතනික ගැටුම සියුම්ව ග්‍රහණය කර ගත් ඉතා කෙටි නමුත් කෙටි නොවිය යුතු නාට්‍යයක් නැරඹුවෙමි. පටන් ගැන්මේ සිට අවසානය දක්වා කුතුහලය කැටිකර ගත් මොහොතකටවත් හිත වෙනතක රදවන්න නොදී මේ රන්දෝලිගේත් යකඩ දෝලිගේත් සිතුවිලි අතර අපටත් දෝලනය වෙන්න අවස්ථාවක් මෙහි රචකයා නිර්මාණය කර තිබුණි. මෙහි ප්‍රධාන නිළි දෙපල මිලන්කා චන්ද්‍රජිත් සහ සුලෝචනා විතානාරච්චිගේ රංගනය ගැන විශේෂයෙන් සදහන් කළ යුතුමය. එය ඉතාමත් විශිෂ්ඨ රංගනයක් බව නැරඹූ ප්‍රේක්ෂ පිරිස සාක්කි දරනු ඇත.

ඕස්ට්‍රේලියාවේ වෙසෙන අපට විශිෂ්ඨ ගණයේ සිංහල නාට්‍යයක් නැරඹීමට ලැබීම ඉතා දුර්ලබ අවස්ථාවකි. එවන් අඩුවක් සපුරාගත් අවස්ථාවක් විය මෙම රන්දෝලි සහ යකඩ දෝලි කරළියට ගෙන ඒම.

"රන්දෝලි සහ යකඩදෝලි " නම් ස්වතන්ත්‍ර නිර්මාණයකින් අප හමුවූ උදය බංඩාරයන්ට අපගේ සුබ පැතුම්!!!

---

**16 වන පිටෙන්**

''කෝ විජේදාස? බව්ද විජේදාස. එනව.. එනව..'' වෙනත් තැනක වාඩි වී සිටි විජේදාස කෙමෙන් කෙමෙන් ලොකු මහතා අසලට ආවේ ය.

විජේදාසගේ කනෙන් අල්ලා සෙලවූ ලොකු මහතා ''යනව ඔෆිස් එකට. ඔෆිස් එකේ ඉන්නව මං එනකං.'' කියමින් පන්ති කාමරයෙන් පිටවුණේ ''ඔය ළමයට තුවාල උණා ද?'' යි අසා බලමිනි.

ටික වේලාවකින් විජේදාස පන්තියට ආවේ ඔරවා ගත් මුරණ්ඩු පෙනුමක් මුහුණින් මවා ගෙන ය. කෙළින් ම මා ළඟට පැමිණි ඔහු ''අද දෙන්නම් ජම්බු තමුසෙල දෙන්නට ම. මාව ප්‍රින්සිපල්ට අල්ල දීල දැන් ඉන්නව තොත්ත බබාල වගේ'' කියමින් පුටුවේ වාඩි වුණේ පන්තියේ ගුරුතුමියගේ පැමිණීම නිසා ය.

දැන් මගේ සිත ව්‍යාකූල ය. වැටුණේ මා ය. වරද කළේ ඔහු ය. වරදට දඬුවම් ලැබුණේ වරද කළ නිසා ය. එහෙත් දැන් වරදකරුවන් වී සිටින්නේ මා සහ ආනන්ද ය.

විජේදාස වරින් වර මා දෙස සහ ආනන්ද දෙස බලයි. මා පිටුපස බලන සැම මොහොතක ම ඔළුව ඉහළට පහළට සොලවා කියන්නේ ''දෙන්නම් වැඩේ'' කියා ය. ඔහු අසල සිටින යාළුවාට මොනවාදෝ හෙමින් සැරේ මුමුනමින් කියන්නේ අපට ගහන බවක් විය හැකි ය. තව ම මා පාසලට පැමිණ පැය දෙකක්වත් ගත වී නැත.

ගුරුතුමියක් සාහිත්‍ය පාඩමක් උගන්වයි. ඇය මහා හඬකින් කවියක් කියවයි. ඇය අත ඇති පද්‍ය රසයේ මුල් පිටුව මට පෙනේ. අද මා අතට ලැබුණු, අතින් ලියා ගල් අච්චුවෙන් අච්චු ගසා තිබුණු පොත් ලැයිස්තුව තුළ ද මේ පොතේ නම තිබුණා මතක ය. ගුරුතුමියගේ ලයාන්විත ගායනය තුළින් හැඟෙන්නේ පද්‍ය රසය නම වගේ ම රසවත් ඇත කියා ය. එහෙත් පාඩමින් රසයෙන් කුල්මත් වීමේ පින මට අහිමි වී ගොස් ඇති බවක් හැඟෙයි.

''සිරියාවතී පළවැනි කවිය කියන්න පොත බලාගෙන'' ගුරුතුමිය ගැහැනු ළමයකුට පැවරුවා ය. සිරියාවතී නැගිට තාලයට ගායනා කළා ය.

අල් ලට සිඟාවත් රසනැති කැවිලි කකා  
වල් කොළ බිම අතුට නිදි නොලැබ දුක් තකා  
කල් ගිය රෙදි වැරලි ඇඳ දැලි කුණෝන් වකා  
ඇල් මෙන් අකුරු උගනිව් ඉදිරි වැඩ තකා

''ඊළඟ'' ගුරුතුමියගේ අණින් ඊ ළඟ ළමයා ද එම කවිය ම ගායනා කළේ ය. දැන් හැම අයෙක් ම වරින්වර නැගිට පොත බලාගෙන කවිය කියවති. මටත් කවිය ගායනා කිරීමට අවස්ථාව ළඟා වී ඇත. ව්‍යාකූල සිතට කිසිවක් සිතාගත නොහැකි ය. දැන් මගේ වාරය පැමිණීමට ආසන්න ය. තව සොලවන්නේ ගුරුතුමියට නොදැනෙන්නට ය.

මා අසල සිටින ශිෂ්‍යයාගේ වාරය පැමිණීමෙන් ඔහු නැගී සිටියේ ය. ඔහු ද කවිය කියන විට තැනින් තැන පැටලුණි. කලින් පාසලේ දී මුලින් මා පාඩම් කර ඇති මෙම කවිය ගායනා කිරීම මට ඉතාමත් පහසු ය. එහෙත් මගේ හද ගැස්ම වැඩි ය. විජේදාසගෙන් විඳින්නට සිදුවන ගැහැට පිළිබඳ චිත්ත රූපය වැඩි වී මගේ සිත මහ කලබලයක ය.

''අලුත් ළමයා'' ගුරුවරිය පැවසුවේ මට ය. එවිට අල්ලපු ළමයාගේ පොත රැගෙන නැගිට්ටෙමි. කවිය කියවීමට කට අරින්නට හැදුවත් එය කළ නොහැකි ය. කීප විටක් ම උත්සාහ කළත් හිත මුල විජේදාස ය. දැන් පන්තියේ සියල්ලන් ම මා දෙස බලා සිටින බවක් හැඟේ. දැන් කවුරුත් මට හිනැහෙනු ඇත.

''කියන්න කියන්න'' ගුරුතුමියගේ කාරුණික කට හඬට මම අවදිවෙමි. එහෙත් කවිය කීමට නොහැකි ය.

මට ඇඬුණේ ඉබේට ම ය. මුහුණ දෙපසින් කඳුළු බේරෙයි. මම අඬන්නට පටන් ගත්තෙමි.

''ඇයි මොකද? කියන්න බැරි ද? හා හා එහෙනන් වාඩිවෙන්න. ඊළඟ'' ගුරුතුමිය පැවසුවා ය.

වාඩි වීමට පෙර පිටුපස හැරී පුටුව තිබේදැයි බැලුණේ ඉබේට ම ය. වාඩි වුණු මම ඩෙස් එකට ඔළුව තබාගෙන ඇඬුවෙමි.

එම කවිය කීමට මට අපහසු නැත. ඉතා හොඳින් ගායනා කළ හැකි ය. එහෙත් මට කියා ගැනීමට නොහැකි විය. මා කිසිවක් බැරි මෝඩයකු හැටියට ගුරුතුමිය සිතිය හැකියයි ඇති බය ද දැඩි ය. මා කවදාවත් කලින් ඉස්කෝලේ පන්තියක පැරදී නැත. ඕනෑ ම දෙයකට මුලින් අත ඔසවන්නේ මා ය. කිසිවක් කීමට ගුරුවරයාගේ අණ ලැබෙන තුරු ඉවසුමක් නැත. එහෙත් අද මේ ලොකු ඉස්කෝලේ දී අසරණ වී ඇත.

නාද වුණු බෙල් එක කීවේ විවේක කාලය පැමිණ ඇති බව ය යි හැඟුණේ අලුත් පාසලේ ළමයින්ගේ ශබ්දයත් ඩෙස්, පුටු ඇදෙන ශබ්දයත් දෙසවන් සිදුරු කරගෙන වදින නිසා ය. ගුරුතුමිය පන්තියෙන් පිටට යනවාත් සමගම විජේදාස මා ළඟට පැමිණ, ''අද කන්න බලාගෙන හිටපන් හොඳේ'' යි පවසා මගේ අතකින් තරමක් රිදෙන්න කොනිත්තා ඉදිරියට ගියේ පන්තියට බනිස් ගෙන එනු දැකීමෙනි.

කාඩ්බෝඩ් පෙට්ටියක් පිරෙන්නට බනිස් ඇත. ළමයි බනිස් ගන්නේ පොරකමිනි. සමහර ළමයි බනිස් ගෙඩිය අතට ගෙන එහෙ මෙහෙ හරවා ප්‍රමාණය මැන බලන්නේ තවත් ළමයකු අත ඇති බනිස් ගෙඩිය දෙස ද බලමිනි.

කලින් පාසලේ බනිස් බෙදූ ආකාරය මීට වඩා කොතරම් වෙනස් ද? බනිස් පෙට්ටිය ළඟ ගුරුවරයාත් සිටී. සියලු ම ළමයින් පේළියට පැමිණ බනිස් ... මෙන් පසුව ය, පන්තියෙන් නැගිට ඉවතට යා හැකි වන්නේ. එහේ මෙහේ පරතරය ඉතා විශාල ය.

මගේ බනිස් ගෙඩිය ගෙනැවිත් දුන්නේ මා අසල සිටි ආනන්ද ය. ඔහු බනිස් ගෙඩිය මට දෙන ගමන් ''නම මොකක්ද'' යනුවෙන් ඇහුවේ කෙළින් ම මගේ මූණ දෙස බලාගෙන ය.

''පියසේන'' දැන් මගේ සිතේ බර ගතිය තරමක් වෙනස් වී ඇත.

''වතුර බොන්න යනවද?''  
මම හිස සැලුවෙමි.

ඔහු මගේ අතකින් අල්ලා ඇද්දේ වතුර බීමට යාමට ය. මා ඔහු සමග ළිඳ ළඟට ගියේ ද විජේදාස කොහෙන් පැමිණ තඩි බායි දැයි වටපිට බලමිනි.

''මොකක්ද බලන්නෙ බය වෙන්න එපා. අඹතැරිය දැන් තාච්චි පනින්න යන්න ඇති. අපි යමු.'' ඔහුට මගේ හිත තුළ තෙරපෙන ගැටලුව තේරුණා විය හැකි ය.

මිදුල අයිනේ දෙල් ගහ ළඟින් මිනිමල් ගාල මැදින් ඇති අඩි පාරෙන් පහළට බැස ගිය විට ළිඳ හමුවේ. ළිඳ වටා ළමයින් පිරී ඇත. වතුර බාල්දිය ගැනීමට දෙදෙනෙකු වතුර බී ඉවර වන තුරු, බලා සිටිය යුතු ය. ගැඹුරු ළිඳෙන් වතුර ඇදගත යුතු වන්නේ දිග කඹයකිනි. බොලොක්කයේ චිරිකිරි ශබ්දය කන් හිරිවටන ශබ්දයකි. ළිඳ අඩියට පනිට්ටුව දමා වතුර පුරවා උඩට අදින විට පනිට්ටුවේ වතුරවලින් හතරෙන් තුනක් පමණ නැවත ළිඳට වැටේ. පනිට්ටුව අඩියේ ලොකු හිලක් ය.

මා සමග පැමිණි ආනන්ද ළමයින් දෙපසට කර එකවිට ම වතුර පනිට්ටුව අල්ලාගෙන කඹය ද උදුරාගෙන පනිට්ටුව ළිඳට දමා ඉතා වේගයෙන් උඩට ඇද්දේ ය. පනිට්ටුවේ ඉතිරි වූ වතුර ප්‍රමාණය අප දෙදෙනාට ම ප්‍රමාණවත් විය. පනිට්ටුව උදුරා ගත්තාට කිසිවෙක් විරුද්ධ නොවීම මට පුදුමයකි.

''අපි යං''

ආනන්ද මාත් සමග නැවත පන්තියට ඒමට පිටත් විය. ඔහු මට පෙරටුව ඉහළට ගමන් ගනී. එකවිට ම කොහේදෝ සිට පැමිණියේ විජේදාස ය. ඔහු දැන් ඉදිරියට එයි. මට අල්ලාගෙන තඩි බායි දෝ සැකයෙන් මම ද ආනන්ද පිටුපසින් වැටී ගියෙමි. පෙරටුව යන ආනන්ද පසුකළ සැණින් විජේදාස මගේ දෙකකුල් පටලැවෙන ආකාරයට ඔහුගේ කකුල ඉදිරියට කළේය. මිනිමල් ගාල මැදට මා ඇදගෙන වැටුණි.

''අඩෝ අතැරපන්'' කියමින් එකවිට ම අත දිගු කළ ආනන්ද විජේදාසට පහරක් ගැසී ය. විජේදාස ද පෙරළා ඔහුට පහර ගැසීමෙන් පසු එකට බදාගෙන දෙදෙනා පොර බදන්නට වූයෙන් දෙදෙනා ම මගේ ඇඟ උඩට ඇදගෙන වැටුණි. දෙදෙනා මගේ ඇඟ මතට වැටීමෙන් ඇතිවුණු වේදනාව මුලින් වැටීමෙන් ඇති වූ වේදනාවට වඩා අධික ය. අපි තිදෙනා ම බොහෝ අමාරුවෙන් නැගිට්ටෙමු. ළමයි පිරිස වටේ බලා සිටිති.

නැගිටගත් ආනන්ද යළි විජේදාසට පා පහරක් එල්ල කළේ එකවිට ම ය. එම පා පහර කාගෙන විජේදාස පසු පසට විසිවී වෙර ගෙන නැවතී අත මිට මොළවා ගෙන ආනන්දට කඩා පනින්නට සූදානම් විය. එහෙත් ඔහු එකවිට ම කෙළින් ම දුර බලා අත් දෙක ම පහතට දමා ගනිමින් එතැනින් ඉවත් විය. අප සිටින තැන පසු කරගෙන ගියේ මිටි මහත්තයා ය.

''බය වෙන්න එපා, ගැහුවොත් උඹත් ගහපන්, මං බලා ගන්නම්.''

ආනන්ද ගේ නිර්භීත කම, ඔහු, මගේ සිත තුළ වීරයෙකු කරන්නට සමත් විය.

**මතු සම්බන්ධයි**

පොත පත දෙසට හෙලන විමසුම් ඇස

**"සාහිත්‍ය සම්භාෂණ"**

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන  
ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන  
"සාහිත්‍ය සම්භාෂණ"

**එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන්**

සෑම මසකම අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.

අන්තර්ජාලයෙන් www.sbs.com.au/yourlanguage/sinhalese/